| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2025 |
| 7 ශ්‍රේණිය | **නර්තනය** |

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

**I කොටස**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

1. දණ්ඩි කඳ උපයෝගී කරගෙන නර්තනය කරන සරඹ වන්නේ,
   i. අත් සරඹ
   ii. පා සරඹ
   iii. ඉලංගම් සරඹ
   iv. ගොඩ සරඹ

2. නර්තනයේ අවශ්‍ය හැඩතල සකසා ගැනීමට ඉතා වැදගත් වන්නේ,
   i. අංගහාර
   ii. මණ්ඩිය
   iii. ගායනා
   iv. නම්‍යතා අභ්‍යාස

3. ගායනයේදී මෙන්ම නර්තනයේදී තාල තබා ගැනීමට යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ වන්නේ,
   i. ගැට බෙරය
   ii. තාලම්පට
   iii. රබාන
   iv. දඬු බෙරය

4. ශ්‍රී ලංකාවේ නර්තන සම්ප්‍රදායන් ගණන වන්නේ,
   i. පහකි
   ii. එකකි
   iii. තුනකි
   iv. හයකි

5. තුරගා වන්නමට අදාල තිත් රූපය වන්නේ,
   i. මැදුම් මහ දෙතිත
   ii. සුළු මහ දෙතිත
   iii. සුළු මැදුම් දෙතිත
   iv. සුළු තනි තිත

6. විකල්ප භාණ්ඩයක් වන්නේ,
   i. උඩැක්කිය
   ii. රබාන
   iii. ටොනික්පියන් චල් වළල්ල
   iv. ගැටබෙරය

7. වෙස් ඇඳුම් කට්ටලය අයත් නර්තන සම්ප්‍රදාය වන්නේ,
   i. පහතරට සම්ප්‍රදාය
   ii. උඩරට සම්ප්‍රදාය
   iii. සබරගමු සම්ප්‍රදාය
   iv. ඉන්දියානු නර්තන සම්ප්‍රදාය

8. උඩරට පා සරඹ ගණනින්
   i. 10 කි
   ii. 8 කි
   iii. 12 කි
   iv. 24 කි

9. 'තත් පිත් තොං නං තා' මෙය,
   i. ගොඩ සරඹයකි
   ii. පා සරඹයකි
   iii. හමාර පදයයි
   iv. කස්තිරමකි

10. උඩරට නර්තනයේ ශිල්පය ප්‍රගුණකළ ආධුනිකයා තම ශිල්පීය දක්ෂතා පෙන්වන අවස්ථාවක් හඳුන්වන්නේ,
   i. මඩු බැසීමේ මංගල්‍යය
   ii. ගුරු වරම්දීමේ මංගල්‍යය
   iii. හිසවෙස් පැළඳවීමේ මංගල්‍යය
   iv. කළ එළි බැසීමේ මංගල්‍යය

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රශ්නවලට පිළිතුර තෝරා හිස්තැන මත ලියන්න.**

(මණ්ඩිය / 18 කි / නමස්කාරය / ගොප් කොළ / මහ තනි තිත)

11. නර්තනය ආරම්භ කිරීමට පෙර …………………….. සරඹය කරනු ලබයි.
12. උඩරට සම්ප්‍රදායේ වන්නම් ගණන …………………….. කි.
13. නර්තනයේ මූලික ඉරියව්ව …………………….. වේ.
14. මාත්‍රා හතරේ තාල රූපය …………………….. ලෙස ද හඳුන්වයි.
15. සැරසිලි අංගයක් නිර්මාණයට …………………….. භාවිතා කරයි.

(ල. 10)

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.**

| | |
|---|---|
| 16. මාත්‍රා 2 +3 දෙතිතට අයත් වන්නමකි | රාමසාන් |
| 17. උඩරට සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය | කස්තිරම |
| 18. උපවාස කාලයක් පවත්වන උත්සවය | තල මල |
| 19. උඩරට වන්නමක් අවසානයේ නටනු ලබයි | ගැටබෙරය |
| 20. මෙම මල පිපීම ගමට අසුභ බව විශ්වාස කරයි | තුරඟා වන්නම |

(ල. 10)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 02 කට පිළිතුරු සපයන්න.**
- **නිපුණතා මට්ටම 3.0 'සම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ' පාඩම ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**

1.
   i. සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ 02ක් නම් කරන්න. (ල. 2)
   ii. විකල්ප වාද්‍ය භාණ්ඩ 02ක් නම් කරන්න. (ල. 2)
   iii. විකල්ප වාද්‍ය උපකරණයක් නිර්මාණය කරන අයුරු විස්තර කරන්න. (ල. 4)
   iv. මෙම භාණ්ඩ ඇසුරෙන් ඉදිරිපත් කළ හැකි සමූහ වාදක අවස්ථා 02ක් ලියන්න. (ල. 3)

2.
   i. ඔබ උගත් ගැමි නැටුම් වර්ග 03ක් නම් කරන්න. (ල. 2)
   ii. ඉන් එක් වර්ගයකට අයත් කවියක් ලියන්න. (ල. 4)
   iii. ද්‍රවිඩ ගැමි නැටුම් වර්ග 02ක් නම් කරන්න. (ල. 4)

3.
   i. අතීතයේ දවුල භාවිතා කල වාදන අවස්ථා 03ක් ලියන්න. (ල. 3)
   ii. දවුල සෑදීමට ගන්නා දැව වර්ග 02ක් ලියන්න. (ල. 2)
   iii. දවුලේ රූප සටහනක් ඇඳ කොටස් 5ක් නම් කරන්න. (ල. 5)

4.

i. තනි තිතේ ප්‍රභේද ගණන කීයද? (ල. 3)

ii. දෙතිතේ ප්‍රභේද නම් කරන්න. (ල. 3)

iii. දවුලේ රූප සටහනක් ඇඳ කොටස් 4ක් නම් කරන්න. (ල. 4)

5.

i. ශ්‍රී ලාංකීය නර්තන සම්ප්‍රදායන් නම් කරන්න. (ල. 3)

ii. ඒවා ප්‍රචලිත ප්‍රදේශ 02ක බැගින් ලියන්න. (ල. 3)

iii. එම සම්ප්‍රදායන් වලට අයත් ශාන්ති කර්මය නම් කරන්න. (ල. 4)